**I** - කොටස - (ලකුණු 40 යි.)

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 02 | 2 | 03 | 4 | 04 | 3 | 05 | 3 | 06 | 1 | 07 | 2 | 08 | 4 |
| 09 | 2 | 10 | 4 | 11 | 2 | 12 | 4 | 13 | 4 | 14 | 4 | 15 | 3 | 16 | 4 |
| 17 | 3 | 18 | 1 | 19 | 2 | 20 | | 21 | 3 | 22 | 2 | 23 | 2 | 24 | 2 |
| 25 | 1 | 26 | 2 | 27 | 4 | 28 | 2 | 29 | 2 | 30 | 4 | 31 | 3 | 32 | 1 |
| 33 | 4 | 34 | 4 | 35 | | 36 | 2 | 37 | 3 | 38 | 2 | 39 | 3 | 4 | 2 |

**II** - කොටස

01 (1) භෛරවී (2) එදිරිවීර සරච්චන්ද්‍ර (3) භූපාලි (4) ශුද්ධ තාන

(5) ග රි නි රි | ස - - - | නි රි ග ම් | ප ම් ග ප | රි ග රි ස

(6) යමන් (7) 32

(8) තාන තනා තන තනෙනා තෙතන තනා තන තනෙනා - තාන තනා තනෙනා තනෙන තන - තෙතන තනා තනෙනා

(9)  (10) වෙසක් කැකුළු අතු අග ඉඳ

02 (1) 1. කාෆි 2. බිලාවල් 3. භූපාලි 4. භීමපලාශ්‍රී 5. යමන්

(2) ස්ථායි

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස | ස | රි | රි | ග | ග | ම | ම | ප | - | - | ම | ප | ධ | නි | සං |
| ස | ඳ | ව | ති | හි | නැ | හෙ | න | වා | s | s | සි | නා | s | සි | s |
| නි | ධ | ප | ම | ග | ග | රි | රි | රි | ප | ම | ප | ම | ග | රි | ස |
| ම | ව් | බි | ම | සි | ඹ | සි | ඹ | න | ල | ව | න | වේ | s | ලේ | s |


අන්තරා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ම | ම | ප | ධ | නි | නි | සං | - | රිං | ගං | රිං | සං | නි | ධ | නි | - |
| ඇ | ගෙ | ත | රු | ද | රු | වෝ | s | අ | ත් | ඹ | ස | වා | s | ලා | s |
| ධ | ධ | ප | ප | ප | ධ | ප | ම | ප | - | - | ම | ප | ධ | නි | සං |
| ම | ව් | භූ | s | මි | ය | ව | ඳි | ති | s | s | සි | නා | s | සි | s |
| නි | ධ | ප | ම | ග | ග | රි | රි | රි | ප | ම | ප | ම | ග | රි | ස |
| තු | ටු | ක | ඳු | ලැ | ලි | ස | ල | මි | න් | ගී | s | ග | ය | තී | s |

(3) සං සං ධ ප | ග රි ස රි | ග - ප ග | ධ ප ග -
ග ප ධ සං | රිං සං ධ ප | සං ප ධ ප | ග රි ස -

(4) නිරි ගම් පධ නිසං | නිධ පම් ගරි ස-
නිධ නිධ පම් පම් | ගරි ගරි නිරි ස-

03 (1) 

(2) 

(3) සං ධ - | - ප ම | ප - ධ | සං - - | රි නි - | - සං රිං | ගං - රිං | මං - -

04 (1) ද්‍රවිඩ ආභාෂයෙන් මිදී දේශීයත්වයට මුල්තැන දෙමින් ගොඩනැගුන කථා තේමාවකින් යුක්ත වීම / දේශීය චිත්‍රපට තාක්ෂණය නොදියුණු මට්ටමක පැවති එම වකවානුවේ දේශීය තාක්ෂණය හා තාක්ෂණ ශිල්පීන්ගේ ප්‍රමුඛ දායකත්වයට මුල්තැන දෙමින් චිත්‍රපට බිහිවීම / ද්‍රවිඩ හා හින්දි චිත්‍රපට සංගීත අනුකරණයෙන් සම්පූර්ණයෙන්ම මිදී ස්වතන්ත්‍ර සංගීත නිර්මාණයන්ගෙන් සමන්විත ගීත හා පසුබිම් ගීත සහිත නිර්මාණයක් වීම / පසුබිම් ගීත රචනයන්හි අපූර්වත්වය සංකේතවත් කරමින් නවතම චිත්‍රපට පසුබිම් ගීත රචනාවන් එළිදැක්වීම / හින්දි හා ද්‍රවිඩ චිත්‍රපටයන්හි නළු නිලියන්ගේ අනුකරණයෙන් ඈත්වූ නවතම රංගන ශෛලියක් ආරම්භ වීම.

(2) සංගීත අධ්‍යක්ෂක - ආර්. මුත්තුසාමි / ගායක ගායිකාවන් - ධර්මදාස වල්පොල, ලතා වල්පොල / සිරිනි සරුසර වීලා, හඳ රාහු මුඛයෝහි ගිලුනා

(3) නිධානය, දූලීකා

(4) චිත්‍රපටයේ නම - සත් සමුදුර / සංගීත අධ්‍යක්ෂ - සෝමදාස ඇල්විටිගල / තේමා ගීතය ගැයූ ගායකයා - පණ්ඩිත් අමරදේව 4 තේමා ගිත රචකයා - මහගම සේකර

05 (1) සින්දු වන්නම් 32 ක් ඇත. / උපුල්වන් දෙවිඳු උදෙසා නිර්මාණය කර ඇත. 4 වන්නම යන වෙනුවට වෘත්තයක් හා තාලයක් දක්වා ඇත. / සින්දු වන්නමෙහි කොටස් තානම. කවිය, බෙරපදය, ඉරට්ටිය

(2)

| ∧ | | | / | | | | ∧ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ම | ධ | - | ප | - | ම | - | ග | - | - | ග | - | ම | - |
| තෙ | න | s | තෙ | s | න | s | තෙ | න | s | තෙ | s | නෙ | s |
| ප | ම | - | ධ | - | ප | - | ම | - | - | ම | - | ම | - |
| නා | s | s | s | s | තෙ | s | න | ම් | s | තෙ | s | න | s |
| + | + | + | ග | - | ම | - | ප | - | - | ධ | - | - | - |
| + | + | + | තෙ | s | නෙ | s | නා | s | s | s | s | s | s |
| ප | ම | - | ධ | - | ප | - | ම | - | - | - | - | - | - |
| s | s | s | s | s | s | s | s | s | s | s | s | s | s |

(3) මැදුම් මහ දෙතිත

| ∧ | | | / | | | | ∧ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| දො | ං | ජී | ජී | ජී | ග | ත | ජී | ග | ත | දො | ං | ත | ක |

06 නූර්ති සම්ප්‍රදාය අපට දායාද වූයේ භාරතයෙනි. ඒ අනුව උතුරු ඉන්දීය නාට්‍ය කණ්ඩායමක් වන කේ. එම්. බලිවාලා ප්‍රමුඛ නාට්‍ය කණ්ඩායම විසින් රඟ දැක්වූ නාට්‍යයක් ඇසුරින් මෙම නූර්ති ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත විය. නූර්ති ශ්‍රී ලංකාවේ නිෂ්පාදනයෙහිලා පුරෝගාමී වූයේ ශ්‍රී දොන් බස්තියන්, ජෝන් ද සිල්වා වැන්නවුන්ය. මුල්ම නූර්තිය ලෙස රොලිනා හැඳින්විය හැකිය. මුල් කාලයේ ඉන්දියාවෙන් සංගීතඥයින් ගෙන්වා මෙම නූර්ති සඳහා සංගීතය සැපයීය. පසුකාලීනව ශ්‍රී ලංකාවේදී සංගීතඥයින් විසින් සංගීතය නූර්ති සඳහා ලබා දුන්හ.

ඉන්දියානු රාගධාරි සංගිතයේ ආභාෂය නූර්ති සඳහා නොඅඩුව ලැබී ඇත. රාගධාරි සංගීතයේ රාග හා තාල නූර්ති සඳහා මූලිකව යොදාගෙන ඇත. ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය තබ්ලාව වන අතර ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය සර්පිනාවයි. දොහොරාව නමැති විශේෂිත ගායනාංගය සමහර නූර්තිවල දක්නට ලැබේ. මෙය තාලයකින් තොරව ගැයෙන කොටසකි. ස්ථායි අන්තරා ආකෘතියට නූර්ති නිර්මාණය වී ඇත.

නාඩගම් ශ්‍රි ලංකාවේ මුහුදුබඩ තීරයේ හලාවත, මීගමුව, තංගල්ල ආදි ප්‍රදේශවල ව්‍යාප්ත විය. පස් ගොඩකර ගත් උස් ස්ථානයක නාඩගම් රඟ දක්වනු ලැබිය. නාඩගම් රාත්‍රි කාලයේ දින 7 ක් පුරාවට රඟ දැක්වූ බව සඳහන් වේ. නාඩගම් හි චරිත හඳුන්වන්නා පොතේගුරා නමින් හඳුන්වන අතර නාඩගම් සම්ප්‍රදායේ පොදු චරිත ලෙස බහුභූතයා, සෙල්ලවි, ළමා යන චරිත නම් කළ හැක. නාඩගම්හි සංගිතමය ලක්ෂණ සඳහා දකුණු ඉන්දියානු කර්ණාටක සංගීතයේ ආභාෂය ලැබී ඇත. දකුණු ඉන්දියාවේ තෙරුක්කුත්තු නම් නාට්‍ය විශේෂයේ ආභාෂයෙන් නාඩගම් ශ්‍රී ලංකාවේ ස්ථාපිත විය. මද්දලය මෙහි ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩයයි. ඊට අමතරව හොරණෑව, වයලීනය ස්වර වාදනයට යොදාගනී. උරුට්ටුව, තෝඩායව වැනි ගීතාංග ද, පසන් තිර්ලාපන, බාපු වැනි නාඩගම් තාල ද යොදාගැනීම විශේෂත්වයකි. මුලින්ම නාඩගමක් නිෂ්පාදනය කළේ පේදුරු සිංඤෝයි. සිංහලෙන් නාඩගම් නිෂ්පාදනයේ ආරම්භකයා වන්නේ පිලිප්පු සිංඤෝයි. ඔහුගේ මුල්ම නාඩගම ඇහැලේපොලයි.

The National e-learning Portal for the General Education